**මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කිය විය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දි මිලදී ගෙන තිබුණු රු.2,013,054 ක පරිගණක උපාංග, CCTV කැමරා පද්ධතිය හා අනෙකුත් විවිධ උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබිය යුතු වීම |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු රු.1,550,063 ක් වූ උසාවි දඩ ආදායමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | පෙන්වා දුන් අඩුපාඩුව පිළි ගන්නා බව දන්වමි. | |
| (ඇ) | භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කළ භාණ්ඩ විෂයයන් 20 ක් අදාළ වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. | |
| (ඈ) | ඉකුත් වර්ෂයේ දී, රු.2,097,710 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.6,767,422 ක් ලෙස ඉඩම් වැඩි දියුණු කිරීමට හා ගොඩනැගිලි ඉදිකිරීමට දරා තිබුණු රු.8,865,132 ක් ප්‍රාග්ධනිගත කර නොතිබුණි. | ගිණුම් තැබීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඉ) | වරිපනම් ආදායම් කළමනාකරණ මෘදුකාංගය මිල දී ගැනීමට දරා තිබුණු රු.180,000 ක් අස්පෘශ්‍ය වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | |

### 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා අනුරූපී වාර්තා අනුව ශේෂය අතර රු.31,778,022 ක නොසැසඳීමක් විය. | වත්කම් සමීක්ෂණය අවසන් කර ඇති අතර, ලේඛන නිවැරදිව යාවත්කාලීන කරන බව දන්වමි. | උපලේඛන හා අනුරූපි වාර්තා නිවැරදි කළ යුතු වීම |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම් ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරිම නිසා, එකතුව රු.26,404,497 ක ගිණුම් විෂයයන් 08 ක් විගණනයේ දී, සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී නිවැරදිව ලේඛන පිළියෙල කිරීමට කටයුතු කරමි. | සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු වීම |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,113,686 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,704,703 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.7,931,477 ක වරිපනම් බදු අය කර නොතිබුණි. | නව තක්සේරුව මත බදු මුදල් වැඩි වීම හා කොරෝනා වසංගතය යටතේ අය කිරීම් දුෂ්කර වූ බව දන්වමි. | හිඟ ආදායම් අය කළ යුතු වීම |
| (ආ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.37,185,145 ක මුද්දර ගාස්තු අය කර නොතිබුණි. | ඉදිරියේ දී, මුදල් අය කරන බව දන්වමි. | හිඟ ආදායම් අය කළ යුතු වීම |

### 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් සමාලෝචිත වර්ෂය තුළ දී රු.262,608 ක වටිනාකමකින් යුත් අධිභාරයක් පනවා තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | අදාළ පාර්ශව වෙත දන්වා යවා ඇතත්, මේ වන විටත් ගෙවීම් සිදු කර නොමැති බව දන්වමි. | අධිභාර සහතික ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **තායිලන්ත විදේශ සංචාරය** | | |
| (අ) | තායිලන්තයේ පුහුණුවකට මහජන නියෝජිතයින් 05 දෙනෙකු සහභාගී කරලීමට රු.800,000 ක් සංචාරක නියෝජිත ආයතනයක් වෙත 2019 අගෝස්තු 23 වන දින ගෙවා තිබුණ ද, පළාත් පාලන කොමසාරිස්ගේ 2018/11 චක්‍රලේඛය ප්‍රකාරව, විධිමත් පරිදි නිවාඩු අනුමත කර නොතිබීම නිසා, අදාළ පුහුණුවට සහභාගී වී නොතිබුණි. | විධිමත් පරිදි නිවාඩු අනුමත කර ගැනීමට කටයුතු නොකළ බව හා ගෙවූ මුදල් අය කර ගන්නා බව දන්වමි. | ගෙවීම් සිදු කිරීමට පෙර අදාළ නිර්ණායක සම්පූර්ණ කළ යුතු වීම |
| (ආ) | වසර 05 කට අධික කාලයක් ඉක්මවා අය වී නොතිබුණු රු.15,565,731 ක විවිධ ණයගැති ශේෂය හා රු.59,950 ක කසළ බදු ශේෂය අය කිරීමට හා රු.2,874,398 ක කර්මාන්ත හා පොදු පහසුකම් ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී අය කිරීමට, කපා හැරීමට හා නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | අය කිරීම් හා ගෙවීම් නිරවුල් කළ යුතු වීම |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1986 මාර්තු මස 10 වන දින අංක 392/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලැසුම් ගොඩනැගිලි නියෝගවල 22 නියෝගය ඉවත් කර, ඒ වෙනුවට 1996 අගෝසතු 06 වැනි දින අංක 935/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද 22(1) නියෝගය අනුව, බල ප්‍රදේශයේ ඉඩම් අනු බෙදුම් යටතේ 1993 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ සභාවට ලැබී ඇති ඉඩම් කට්ටි 20 ක අක්කර 06 පර්චස් 29 ක් ප්‍රජාවගේ පොදු අවශ්‍යතා සඳහා භාවිතයට ගෙන නොතිබූ අතර, ඉඩම් කට්ටි 07 ක පර්චස් 206.09 ක් සඳහා විධිමත් පරිදි ඔප්පු ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේ දී වැට මායිම් හඳුනා ගෙන, ඇස්තමේන්තු සකස් කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අනු බෙදුම් යටතේ ලද ඉඩම් භාවිතයට ගත යුතු වීම |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ මැද්දේපතන සුසාන භූමියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ඇස්තමේන්තු ප්‍රකාරව, ඉටු නොකරන ලද කාර්යයන් වෙනුවෙන් සහා ලේකම්ගේ නිර්දේශය හා සභාපතිගේ අනුමැතිය යටතේ රු.27,117 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | ඉටු නොකරන ලද වැඩ සඳහා වූ ගෙවීම් වළක්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් සිදු කළ යුතු වීම |